කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 49

මගේ අංකය : ඩීඑම්එස්/ඒ/2012/සීඅයිආර්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2012.12.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/රාජ්‍ය සංස්ථා හා
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

## රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2012 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම

1. **ප්‍රසාද දීමනා ගෙවීම**

2012 වසර සඳහා රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම, 2012.12.19 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇති පරිදි වේ.

1.1 2011 වර්ෂයේදී රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවූ පදනමින්ම 2012 වර්ෂය සඳහා ද එම දීමනා ගෙවිය යුතුය.

1.2 2012 මුදල් වර්ෂය තුළ පාඩු ලබා ඇති රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීම 2011 වසරේ දී සිදුකළ පදනමින් ගෙවිය යුතු අතර ගෙවීමට ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගත යුතුය. මේ සඳහා වන ඉල්ලීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අදාල අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය.

2. **අනුගමනය කළ යුතු පිළිවෙල**

2.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටෙක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

2.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

2.3 ඉහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාල රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වාර්ෂික ගිණුම් 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/21 ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර මත්තෙන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

3. විශේෂ කරුණු

3.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

3.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන සංස්ථා හා රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

3.3 "රාජ්‍ය ව්‍යාපාර සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල වැටුප් ගැටළු" සම්බන්ධයෙන් වූ 2012.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකාරත්වය විසින් අදාල වෘත්තීය සමිති සමඟ, ඔවුන්ගේ ප්‍රසාද දීමනා ද ඇතුළත් වන පරිදි වැටුප් හා දීමනාවන්ට අදාල සාමූහික ගිවිසුම්, 2013.06.30 දිනට පෙර අවසන් කළ යුතුය.

3.4 මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට පරබාහිර කිසියම් ප්‍රසාද දීමනාවක් ගෙවන්නේ නම්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

4. පැහැදිලි කර ගැනීම්

4.1 මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව/ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව/ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසන ලෙස කාරුණිකව දන්වමි.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති
4. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්
5. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්